Department of Education,Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

12 ශ්‍රේණිය
දෙවන වාරය

## විෂය නර්තනය

සැකසුම-එච්.අයි.නීලකාන්ති.
ර/සුමනා බාලිකා විද්‍යාලය.

**නිපුණතාව 06 : නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.**

**නිපුණතා මට්ටම 6.2 : දේශීය නර්තන කලාවේ ආරම්භය හා විකාශය පිළිබඳ ඓතිහාසික තොරතුරු යුග ඇසුරෙන් විමසුමට ලක් කරයි.**

**ක්‍රියාකාරකම 6.2 : දේශීය නර්තනයේ ඓතිහාසික තොරතුරු විමසමු. අනුරාධපුර යුගය**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1.අනුරාධපුර යුගය ලෙස සැලකෙන්නේ

1. ක්‍රි.ව. 543-ක්‍රි.ව.1017 2. ක්‍රි.ව. 5243-ක්‍රි.ව.1017 3.ක්‍රි.පූ. 543-ක්‍රි.පූ.1017 4.ක්‍රි.පූ.243-ක්‍රි.පූ.1017

2. රුවන්වැලිසැයේ පූජා කළ වස්තු අතර නිලි රූපයක් තිබූ බව සඳහන් වන්නේ---------------

1. සමන්තපාසාදිකාවේ 2. දීප වංශය 3.මහා වංශය 4. වංසත්ථප්පකාශිනිය

3.මහා වංශයේ සඳහන් ඒ මිහිපති තෙමේ වසරක් පාසා අඛණ්ඩව බෝධි ස්නාන පූජා -- මෙහි සඳහන් මිහිපති වන්නේ 1.දුටුගැමුණු රජු 2.නිශ්ශංක මල්ල රජු 3. භාතිකාභය රජු 4.පරාක්‍රම රජු

4.නටන ගහපතියා හා ගහපතියාගේ දුව විසින්පවරා දෙන ලදි යනුවෙන් සඳහන් වන්නේ

1.පූර්ව බ්‍රාක්මී සෙල්ලිපිය 2.සැස්සේරුව සිතුල්පවුව කොරවක්ගල සෙල්ලිපි

3. කාලිංග උද්‍යාන ශිලා ලිපිය 4. කාලිංග ක්‍රීඩා විනෝද ලිපිය

5.අනුරාධපුරයේ කුට්ටම්පොකුණෙහි අඩිතාලම යට තිබී හමු වූයේ කුමක්ද

1.නිලියකගේ ලෝකඩ රූපයක් 2. උඩැක්කි වාදකයෙකුගේ රූපයක්

3. නර්තන ශිල්පියෙකුගේ රූපයක් 4. හොරණෑ පිඹින ස්ත්‍රියකගේ රූපයක්

6.--------------------------- ප්‍රතම වරට වාද්‍ය භාණ්ඩ වැග කොට දක්වාඇත.

7.වංසත්ථප්පකාසිනිය / සමන්තපාසාදිකාව ආදිය --------------- මූලාශ්‍ර වලට අයත් වේ.

8.සැස්සේරුව කොරවක්ගල සෙල්ලිපි පූර්ව බ්‍රාක්මී සෙල්ලිපි ------------- මූලාශ්‍ර වලට අයත් වේ.

9.අනේකතාලාවචරයන් මගින් ඇතෙකු පිරිවරා ධාතු වැඩම වූයේ---------------- ධාතු නිධන් උත්සවයටයි.

10.වීනා/උඩැක්කි/තාලම්පට/හක්ගෙඩි/නළා/එකැස් බෙර රුක්මි ------------ කණුහිස් වල දක්නට ඇත.

11අනුරාධපෞර් යුගයේ නෘතන කලාවේ විකාශනයට රාජ්‍ය අනුග්‍රහය ලැබුණු ආකාරය විස්තර කරන්න.

12.අනුරාධපුර යුගයේ වාද්‍ය භාණ්ඩ භාවිතය පිළිබඳව සාහිත්‍ය මූලාශ්‍ර දෙකක් ඇසුරෙන් විමසන්න.

13. මෙම යුගයේ ඉන්දීය ආභාශය ලැබූ බව මූලාශ්‍ර ඇසුරින් පැහැදිළි කරන්න.